ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 2022/2023
4 වන මට්ටම
පළමු වන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය
**LLU4707 – පවුල් නීතිය**
කාලය පැය (01) එකයි

---

දිනය : 2023 සැප්තැම්බර් 25 　　 වේලාව : පෙ.ව 09.30 - පෙ.ව 10.30

---

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

මුළු ප්‍රශ්න ගණන 02 යි.

එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

**ඔබ විසින් තෝරා ගනු ලබන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු විනිශ්චිත නඩු තීරණ හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඉදිරිපත් කළ යුතුය**

**1.** යාපන වාසිකයෙක් වන ගජේදීපන් මඩකලපුවේ වාසය කරන මීනාක්ෂි සමග පෙමින් බැඳුණි. ගජේදීපන් සහ මීනාක්ෂ එකම කුලයට අයත් නොවන බැවින් ගජේදීපන්ගේ දෙමාපියන් ඔවුන්ගේ සම්බන්ධතාවයට විරුද්ධ විය. අනතුරුව මඩකළපුවට ගොස් ව්‍යාපාරයක් ආරම්භ කළේය. මීනාක්ෂ ඔහුගේ ව්‍යාපාරයට උදව් කළාය. ව්‍යාපාරයට සාර්ථක වූ අතර ඔවුන් විවාහ වීමට තීරණය කළෝය. 2019 දී මඩකලපුවේ මීනාක්ෂිගේ නිවසේදී තාලි උත්සවය පැවැත්විණි. විවාහයෙන් පසු ස්වාමිපුරුෂයා සහ භාර්යාව වශයෙන් ඔවුන් මඩකළපුවේ ජීවත් වූහ. 2020 වර්ෂයේදී ඔවුන්ට පිරිමි දරුවකු ලැබුණි. කෙසේ වෙතත් මීනාක්ෂිගේ මිතුරියක් විසින් ගජේදීපන් සහ මීනාක්ෂිගේ විවාහය ලියාපදිංචි නොකිරීම හේතුවෙන් එය වලංගු නොවන බව මීනාක්ෂිට ප්‍රකාශ කර සිටියාය.

ඉහත සිදුවීම ඇසුරින් පහත අවස්ථාවන්හි නෛතික වලංගුතාව සාකච්ඡා කරන්න

**i.** ගජේදීපන්ට සහ මීනාක්ෂිට ඔවුන්ගේ විවාහයේ වලංගුභාවය දැන ගැනීමට අවශ්‍ය වේ. (ලකුණු 15)

**ii.** සියලු පාර්ශවයන් උඩරටියන් වූයේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේද? (ලකුණු 05)

2. "ශ්‍රී ලංකාවේ නීතිය අනුව සහවාසයෙන් සහ ප්‍රසිද්ධියෙන් සිදු වන විවාහය පිළිබඳ පූර්ව නිගමනය, අඹු සැමියන් වශයෙන් ජීවත් වන පුරුෂයෙකුට සහ කාන්තාවකට තම සම්බන්ධතාව විවාහයක් වශයෙන් නීත්‍යානුකූල කර ගැනීමට උපකාරී වන ක්‍රමයක් වශයෙන් ක්‍රියාත්මක වේ".

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද ? විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)